# සමාජවාදී ජනතා පෙරමුණේ

## මැයි දින සටන් පාඨ - 2014

මැයි දිනයට ජය වේවා !

ලෝක කම්කරු දිනයට ජයවේවා
කම්කරු සමගියට ජයවේවා
වාම සමගියට ජයවේවා
සමාජවාදී ජනතා පෙරමුණට ජයවේවා

කම්හල්වල වැඩකරනා
කම්කරුවනි පෙරට එන්න
ගොවි බිම්වල වැඩ කරනා
ගොවි ජනයිනි පෙරට එන්න

කාගෙද මේ බලවේගේ
ගොවි කම්කරු බලවේගේ
සටන් කරන බලවේගේ
මේක තමයි බලවේගේ

විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරමු !
ජාතික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් දෙමු !
මැතිවරණ ක්‍රමය සංශෝධනය කරමු!
බටහිර කුමන්ත්‍රණ පරාජය කරමු !

කම්කරුවනි අවදි වෙයව්
ජාතිබේද ඉවත දමව්
අලුත් රටක් ගොඩ නගන්න
එකාවගේ සමගි වෙයව්

කම්කරු පඩි වැඩි කරන්න
ගොවි සහනත් ලබා දෙන්න
පාව නොදී සටන් කරන
වමත් සමග එකතු වන්න

තරුණයින්ට රක්ෂා දෙන්න
ශිෂ්‍යයින්ට සහන දෙන්න
දූෂණයන් පිටු දකින්න
වමේ බලය තර කරන්න

කම්කරු අයිතිය රකින්න
ආණ්ඩුවට අපි කියන්නේ
පොදු දේපල සුරකින්නට
ආණ්ඩුවට අපි කියන්නේ

කම්කරුවන් නොමර මරන
වහල් නීති අකුල ගනිව්
සංශෝධන නමින් කරන
වහල් නීති අකුල ගනිව්

ලංගමයත් රැක ගන්නෙමු
දුම්රිය සේවයත් රැකගමු
අධ්‍යාපනයත් සුරකමු
නිදහස් සෞඛ්‍ය සේවයත් රකිමු

ධන පතින්ට අපේ ඉඩම් දෙන්න එපා
ජල සම්පත දෙන්න එපා
අපේ කැලෑ දෙන්න එපා

උතුරෙ සිටින කම්කරුවෙනි
දකුණේ සිටින කම්කරුවෙනි
ජාති බේද ඉවත දමා
පංති සටන පන පොවන්න
සමගි වෙලා පෙරට එන්න

ඇමරිකානු අව් බලයෙන්
අෆ්ගන් රට බිලිගත්තා
ඉරාකයත් බිලි ගත්තා
ලිබියාවත් ගිලගත්තා
සිරියාවට දැන් ගහනවා
ඊළග රට ඉරානයද?

ඇමරිකානු යුද වැද්දෙනි
ඉරානයට අත නොතබනු
ඇමරිකානු ලෝ බලයට
එකතු වෙලා මුණ දෙන්න

ලෝ පුරාම වමේ බලය
නැවත වරක් පෙළ ගැසෙනවා
මාක්ස් දුටුව අනාවැකිය
බෑ කාටත් බොරු කරන්න
ධනවාදයෙ අර්බුදයට
සමාජ වාදය විකල්පේ

එන්.ජී.ඕ. ඩොලර්වලින්
වෘත්ති සමිති බේරගනිමු
එන්.ජී.ඕ. ඩොලර්වලට
වමේ බලය පාව නොදෙමු

රක්ෂා නැති තරුණපිරිස්
රට වටාම විදිබසිව්
රැකියා ප්‍රශ්න විසඳ ගන්න
සුදුසු කමට රැකියාදෙන්න
ආණ්ඩුවට බලකරන්න

රට බෙදන්නේ ජාති වාදේ
රට කඩන්නේ ජාති වාදේ
රට ජාතිය විකුණන් කන
ජාති වාදෙ පළවහරිමු

බඩුවල මිල වැඩි වෙනවා
වතුර බිලත් වැඩි වෙනවා
විදුලි බිලත් වැඩි වෙනවා
බස් ගාස්තු වැඩි වෙනවා
ආණ්ඩුවට අපි කියන්නෙ
දුප්පතාට සහන දෙන්න

ගොවි ණය බර වැඩි වෙනවා
දිලිඳු කමත් වැඩි වෙනවා
ගොවි දුක් බර නිවාලන්න
වැඩි වැඩියෙන් සහන දෙන්න

- රජයේ සේවක වැටුප් වූ රු.**10,000** කින් වැඩි කරනු ! අවමය **30,000** ක් කරනු !
- වතු කම්කරු දිනක වැටුප රු.**800**ක් කරනු !
- පුද්ගලික අංශයේ අවම සේවක වැටුප රු. **15000**ක් කරමු !
- පුද්ගලික අංශයේ සේවකයින්ට රු.**5000**ක සහන දීමනාව ලබා දෙනු.!
- විශ්‍රාමික වැටුප් විෂමතා ඉවත් කරනු !
- බඩු මිල පාලනය කරනු !
- විදුලි ගාස්තු හා ජල ගාස්තු පහත හෙලනු !
- සහල්, පිටි, සීනි, කරවල, පරිප්පු, හාල්මැස්සන්, ළදරු කිරිපිටි, භූමිතෙල්, වැනි අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය අඩු ආදායම් ලාභීන් සඳහා සහන මිලකට ලබා දීමේ වැඩසටහ පිළිවෙලක් ක්‍රියාවට නගමු
- සීඝ්‍රයෙන් ඉහල යන ඖෂධ මිල පහත හෙලීම සඳහා නොපමාවම ක්‍රමවත් වැඩ පිළිවෙලක් ක්‍රියාවට නංවමු
- අධ්‍යාපනය සඳහා ජාතික ආදායමෙන් වෙන් කරන ප්‍රමාණය6% දක්වා වැඩි කරමු
- අධ්‍යාපනය ඇතුළු විවිධ ක්ෂේත්‍ර හමුදා කරණයට ලක් කිරීම වහා නතර කරනු
- යහපාලනයක් ගොඩ නගමු
- ගොවි විශ්‍රාම වැටුප් ලබා දෙමු
- 80'ජූලි වැඩ වර්ජකයින්ගේ ශේෂ වූ ප්‍රශ්න විසඳමු
- ළමා හා කාන්තා හිංසකයින්ට දැඩි දඬුවම් පනවමු
- දැනට ක්‍රියාත්මක වන 24% අය බදු සීමාව 45% දක්වා වැඩි කරනු.
- ආදායම් බදු ගෙවීම් පැහැර හරින්නන්ගෙන් බදු අයකර ගැනීම සඳහා නිසි වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරනු
- දූෂණය හා නාස්තිය තුරන් කිරීමට පියවර ගනිමු

උගත් පාඩම් කොමිසමේ යෝජනා ක්‍රියාත්මක කරනු !
වමේ හා ප්‍රජාතන්ත්‍රවාදී බලවේග වල නව පෙළගැස්මක් ඇති කරමු.

# ලෝකයේ වැඩ කරන ජනතාවට ජයවේවා !
# මැයි දිනයට ජය වේවා !